නිපුණතාව 4.0 - විචල්‍ය අතර පවතින සම්බන්ධතා අධ්‍යයනය කර පුරෝකථනය කරයි.

නිපුණතා මට්ටම 4.7 - සරල ප්‍රතිපායන රේඛාවක් අනුසීහනය කිරීමට අඩුතම වර්ග ක්‍රමය භාවිත කරයි.

- දත්ත කණ්ඩයට හොඳින් ගැළපෙන අනන්‍ය වූ සරල රේඛාවක් සෙවීම සඳහා අඳිනු ලබන සරල රේඛාවේ සිට විසිරි තිත් සටහනේ එක් එක් ලක්ෂ්‍යට ඇති අපගමනවල වර්ගවල ඓක්‍යය අවම වන සේ සරල රේඛාවක් තෝරා ගැනීමේ ක්‍රමය අඩුතම වර්ග ක්‍රමය නම් වේ.
- ප්‍රතිපායන සංගුණකයෙන් අදහස් වන්නේ ස්වායත්ත විචල්‍යය එක ඒකකයකින් වෙනස් වන විට පරායත්ත විචල්‍යය වෙනස්වීමේ සීඝ්‍රතාව වේ.
- ප්‍රතිපායන සමීකරණයේ ස්වායත්ත විචල්‍යය සඳහා ඕනෑම අගයක් ආදේශ කළ විට පරායත්ත විචල්‍යය සඳහා අගය නිමානය කළ හැකිය.එය පුරෝකථනය ලෙස හඳුන්වයි.

1.අඩුතම වර්ග ක්‍රමය යටතේ ප්‍රතිපායන රේඛාවක් අනුසීහනය කිරීමේ වාසි හා අවාසි 5 බැගින් ලියන්න.

2.

X	2	3	5	6	8	9
Y	6	5	7	8	12	11

1.)ඉහත දත්ත විසිරි තිත් සටහනක් මගින් දක්වන්න.
2.)ප්‍රතිපායන සංගුණකය ලබා ගන්න.